# ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය
# තාවකාලික පදනම මත කළමනාකරණ සහකාරවරුන් බඳවා ගැනීම

- ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම් සපුරා ඇති අයවලුන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.
- පත්වීම් තාවකාලික පදනම මත වන අතර පැමිණීම මත පදනම් වූ දෛනික දීමනාවක් ගෙවනු ලැබේ.
- වැඩ, හැසිරීම හා පැමිණීම මත සේවයේ නැවත පිහිටුවීම් සඳහා සලකා බලනු ලැබේ.
- විශ්වවිද්‍යාලයීය ආකෘතියට අනුව පිළියෙල කල අයදුම්පත් සහතික කල අධ්‍යාපන / වෘත්තීය සුදුසුකම් සහතික සමඟ **ලේඛකාධිකාරී, ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය, රත්මලාන** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ ගෙනවිත් භාරදිය හැකිය.
- අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය **2021.08.19**

<u>පොදු කොන්දේසි</u>

01. ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.

02. අයදුම්කරුවන් තෝරා ගැනීම ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය විසින් අනුමත බඳවා ගැනීමේ පරිපාටියට අනුකූලව සහ සම්මුඛ පරීක්ෂණ ප්‍රතිඵල පදනම් කරගෙන සිදු කරනු ලැබේ.

03. අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවනු ලැබේ.

04. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවීමට පෙර ඔවුන් කෙටි ලැයිස්තු ගත කිරීමේ අයිතිය විශ්වවිද්‍යාලය සතුය.

05. කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල වෙබ් අඩවියෙන් (**kdu.ac.lk**) භාගත කර ගත හැකි ආකෘතිය මඟින් පමණක් අදාළ තනතුර සඳහා ඉල්ලුම් කරන ලෙස අයදුම්කරුවන්ට දන්වා සිටිනු ලැබේ. ප්‍රමාද වී ලැබෙන, අසම්පූර්ණ හෝ නියමිත ආකෘතියට පරිභාහිරව යොමු කරනු ලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

වීඩී කිත්සිරි
ලේඛකාධිකාරී

## කළමනාකරණ සහකාර (තාවකාලික)

<u>**අවම සුදුසුකම්**</u>

**01.** i. සිංහල භාෂාව/දෙමළ භාෂාව
ii. ඉංග්‍රීසි භාෂාව / ඉංග්‍රීසි සාහිත්‍ය
iii. ගණිතය
යන විෂයන්ගෙන් විෂයන් 03 ටම සාමාර්ථ සහිතව එක් වරකදී අ.පො.ස (සා.පෙළ) විභාගයෙන් විෂයන් 06 කින් සමත් වී තිබීම.

සහ

**02.** එක් වරකදී අ.පො.ස (උ.පෙළ) විභාගයෙන් සියදුම විෂයන් (පොදු පරීක්ෂණය හැර) සමත් වී තිබීම.

පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති අය කෙරෙහි ප්‍රමුඛතාවයක් දක්වනු ලැබේ.

**(අ)** පිළිගත් ආයතනයකින් ලබාගත් මාස 06 කට නොඅඩු පරිගණක යෙදවුම් භාවිතය පිළිබද සුදුසුකම්.

සහ

**(ආ)** පරිගණක යෙදවුම් පැකේජ භාවිතය පිළිබද වසර 02 ක පළපුරුද්ද.

**වයස:**අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවු. 18 ට නොඅඩු සහ වයස අවු. 30 ට නොවැඩි විය යුතුය.

<u>**දෛනික වැටුප**</u>

**රු. 1,284/-** ක දෛනික වැටුපක් ගෙවනු ලැබේ.

Source: www.kdu.ac.lk (2021.08.10)